


# අපේ නිදහස් උත්සවය

කවිඳු යාළුවොත් එක්ක මිදුලේ සෙල්ලම් කරමින් සිටියා. “පුතා යාළුවොත් එක්ක මෙහෙට එන්න” කවිඳුගේ අම්මා කතා කළා. කවිඳු යාළුවොත් එක්ක ගේ ඇතුළට ආවා. අම්මා රූපවාහිනිය බලනවා. රූපවාහිනියේ ලොකු උත්සවයක් පෙන්වනවා.

හමුදා පෙළපාළි

යුද්ධ ටැංකි

අහසේ කරණම් ගසන ගුවන් යානා

පැරෂුට් භටයෝ









තවත් බොහෝ දේවල් රූපවාහිනිය මත දිග හැරෙනවා. කවිඳුටයි යාළුවන්ටයි මේක හරි ම ප්‍රහේලිකාවක්.

ඒ හින්දා ම කවීශා ප්‍රශ්නයක් ඇහුවා. “මොකක් ද නැන්දේ මේ උත්සවය?”

“ඒ පුතේ අපේ රටේ නිදහස් උත්සවය.”

“මොකක් ද නිදහස් උත්සවය කියන්නේ?'' ඒ ප්‍රශ්නය ඇහුවෙත් කවීශා ම යි.

“හැමෝම අහගන්නකෝ.” කවිඳුගේ අම්මා උත්තර දෙන්න සූදානම් වුණා.



පළමුවන නිදහස් උත්සවය

“අපේ රට 1815 අවුරුද්දේ ඉඳලා බ්‍රිතාන්‍ය ජාතිකයන්ට යටත් වෙලයි තිබුණේ. 1948 පෙබරවාරි හතරවන දා අපි ඔවුන්ගෙන් නිදහස් වුණා. ඊට පස්සෙ හැම අවුරුද්දක ම පෙබරවාරි හතරවන දා අපි නිදහස් දිනය උත්සවාකාරයෙන් සමරනවා. ඒක අපේ රටේ පවත්වන ජාතික උත්සවයක්.”

“ඒ හින්දා ද අම්මේ තාත්තා අද ජාතික කොඩියක් එල්ලුවේ?” ඒ ප්‍රශ්නය ඇහුවේ කවිඳු. “අන්න හරි. නිදහස් දිනය දවසට ශ්‍රී ලංකාවේ අපි හැමෝම හැම ගෙදරක ම ජාතික කොඩිය ප්‍රදර්ශනය කරනවා. නිදහස් දිනය කියන්නේ අපේ අභිමානය ලෝකෙට ම පෙන්නන දවසක්. ඒ ජාතික උත්සවය තමයි පුතේ ඔය රූපවාහිනියේ පෙන්වන්නේ.” කවිඳුගේ අම්මා උත්තර දුන්නා.

යාළුවෝ හැම දෙනා ම නිදහස් උත්සවය බැලුවා.

